සබරගමුවපළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **11 ශ්‍රේණිය**

முதலாம் தவணைப் பரீட்சை**2018** தரம்**11**

**First Term Test 2018** **Grade 11**

**ක්‍රිස්තු ධර්මය–I කොටස**

**Cristian**

**පැය එකයි**

***One hours***

- **නිවරැදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1. පළමු ආදී පිතෘ වන්නේ.
   1. ආබ්‍රහම්. 2 ඊසාක්. 3 ජාකොබ්. 4 ජෝසප්

2. ටෝරාව යනු
   1. මෝසෙස්ගේ නීතියයි 2. සීනයි ගිවිසුමයි
   3. පංච පුස්තකයයි 4 ඉහත සියල්ලම වේ

3. ඊශ්‍රායල් ජනතාව විනය ගරුක සමාජයක් බවට පත් වුයේ
   1. කානාන් දේශයට යාම තුළින් 2 මෝසෙස්ගේ නායකත්වය මගින්
   3 දස පනත ලැබීම තුළින්. 4 අන් දෙවිවරු ඇදහීම මගින්

4. ක්‍රිස්ටෝස් යන ග්‍රීක වචනයෙහි අර්ථය වන්නේ ,
   1 යහපත්කම 2 ප්‍රේමය 3 කරුණාව

5. ගීතාවලිය පොත ලියවී ඇත්තේ ,
   1. ක්‍රිස්තු වර්ෂ 10 දී පමණය ක්‍රිස්තු පුර්ව 2 දී පමණය
   2. ක්‍රිස්තු පූර්ව 10 දී පමණය ක්‍රිස්තු වර්ෂ 20 දී පමණය

6. එම්මානුවෙල් යන නාමයෙහි අර්ථය මුළු මානව වර්ගයාට ශුභාරංචියක් වුයේ ,
   1. දිවැසිවර ප්‍රකාශන සම්පූර්ණත්වයට පත් වු නිසාය
   2. ආශිර්වාද ලත් කන්‍යාවකගෙන් බිළිඳු උපත සිදුවු නිසාය
   3. ලෝකයේ පාපය දුරු කරන්නා පිළිබඳ දැනුම් දීම සම්පූර්ණ වු නිසාය
   4. දෙවි මිනිස් සැබැඳියාව හා බලාපොරොත්තුව ඉටු වු නිසාය

7. "මරන්නට ගෙන යන බැටළුවකු මෙන්ද උගේ ලොම් කපන්නා ඉදිරිපිට ගොළුව සිටිනා බැටළු පැටවෙකු මෙන්ද" යන උපමාවෙන් උත්ථාන වු ජේසුස් වහන්සේ හඳුන්වා දෙනු ලැබුවේ,
   1. මරණීය අඩුවමට මුහුණ දූන් පේද්‍රුරු තුමා විසින් ලෝවැසි ජනතාවටය
   2. වේද සාක්ෂික ස්තේපන් තුමා විසින් තමා විසින් තම පීඩාකරුවන්ටය
   3. තේවාචාරි පිලිප් තුමා විසින් ඒතියෝපිය නපුංසකයාටය
   4. දිවැසිවර යෙසායා විසින් ජුදෙව් ජනතාවටය

8. දේව ප්‍රකාශන අනුව ක්‍රිස්තුස් වහන්සේ මාංසවත්වීමේ අරමුණක් නොවන්නේ,
   1. දිළිඳුන්ට පසුතැවීම ප්‍රකාශ කිරිම
   2. බිඳුණු සිත් ඇත්තන්ට සුවය ලබා දීම
   3. වහලුන්ට මිදීම ලබාදීම
   4. සිරකරුවන්ට නිදහස ලබාදීම

9. "ආබ්‍රහම්" අපගේ පියා යැයි අභිමානයෙන් උදම් ඇනූ ජුදෙව් වරුන්ට ස්නාවක ජොහාන් තමා අළියෝග කළේ ආබ්‍රහම් මෙන් ,
    1. දේව කැමැත්තට ස්ව කැමැත්ත යටත් කිරිමටය
    2. දේව කැඳවීමට බලාපොරොත්තුවෙන් ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමටය
    3. දේව සබඳතාවයේ පදනම මත ක්‍රියාකාරි ඇදහිල්ල තු0ගළ දිවි ගෙවීමටය
    4. තමා සතු සියල්ල පරාර්ථය පිණිස පරිත්‍යාග කිරිමටය

10. ජුදාහි ඉතාම අල්ප ගෝත්‍රයකින් අධිපතියෙකු නැගී එන බවට දේව ප්‍රකාශනය දැනුම් දුන්නේ ,
    1. දිවැසිවර මීකාය　　2 දිවැසිවර යෙසායාය
    2. දිවැසිවර ජෙරමියාය　　4 දිවැසිවර එසකයෙල්ය

11. "සාමයේ කුමාරයාගේ ආගමනය හේතුකොට ගෙන විමුක්තිය පාදක සාමකාමි නව ලෙවක් පහළ වන්නේ එතුමා මගින් ,
    1. තෝරාගත් ජනතාවට යුක්තිය ඉටුවන නිසාය
    2. මුල් මානව වර්ගයාට ගැළවීමේ මාර්ගය විවෘත වන නිසාය
    3. ජුදෙව් ජනතාවට ව්‍යවස්ථාව වෙනුවට දේවානුග්‍රහය හිමි වන නිසාය
    4. විජාතීන්ට ඇදහිල්ලේ මාර්ගය විවෘත වු නිසාය

12. මෙසියානු මෙහෙවර එඬේරුන් වැනි දීනයන්ට සුවිශේෂි වු බව පිළිගත හැක්කේ
    1. දීනයන් නගා සිටුවීම ක්‍රිස්තු සුබසුනේ අරටුව වු හෙයිනි
    2. ජුදා සමාජය එඬේර ජන කොටස ගැරහීමට ලක් කළ හෙයිනි
    3. බඳු ගෙවීමේ ගැටලුව මත රෝම අධිරාජ්‍යයාගේ ප්‍රතික්ෂේපයට ලක්වු හෙයිනි
    4. මෙම ජන කොටස වැටී සිටි ආගාධයෙන් මුදවාලීමට කිසිවකු නොසිටි හෙයිනි

13. වයස්ගතව දරු සම්පත් නොලත් එලිසබෙත් තුමිය අත්දුටු පුදුමාකාර දේව කරුණාව අපට මග පෙන්වන්නේ
    1. අසීමිත කාලයක් තුළ දෙවිඳුන්ට කන්නලව් කළ යුතුය
    2. නිරන්තර යැඳුමෙන් හා උපවාසයෙන් කාලය ගත තළ යුතු බවය
    3. දේව භක්තියෙන් බලාපොරොත්තු දල්වාගෙන දැහැමි ජීවිතයක් ගත කළ යුතු බවය
    4 දරු සම්පතක් ලැබීමේ අපේක්ෂාවෙන් හුදකලාව දිවි ගෙවිය යුතු බවය

14. දෙවිදාණෝ අපගේ ආයාචනාවලට ප්‍රති උත්තර දෙන ආකාරය අරඹයා අපගේ ස්ථාවරය විය යුත්තේ,
    1. අනාවැකි පවසන අය විමසීමයි
    2. නොපසුබට වීර්යයෙන් යාච්ඤාව නිරතවීමයි
    3. දේව කැමැත්ත පිළිගැනිමට ඉවසීමෙන් ඇදහිල්ල වර්ධනය කර ගැනීමය
    4. විශ්වාසයෙන් බලාපෙරෙතේත තැබීමය

15. ක්‍රිස්තුස් වහන්සේ මිදිවත්තේ සේවයට අනාගතයේදී ඔබට කැඳවීමක් ලැබුණහොත් ඔබගේ පාදයට පහනත් වන පාඨය විය යුත්තේ ,
    1. මක්නිසාද දෙවියන් වහන්සේට කළ නොහැකි කිසි දෙයක් නැත
    2. මෙන්න ස්වාමීනී මා යැව්ව මැනව
    3. මෙන්න මාගේ පණිවිඩය ඔබගේ මුබයෙහි තැබීමි
    4. මම ස්වාමීන් වහන්සේගේ දාසිය වෙමි ඔබ පැවසු ලෙස ඉටු වේවා

16. ඉශ්‍රායෙල් ජුදෙව් කුළුදුල් බිළිදුන් කැප කිරිමේ පිළිවෙතින් අනුස්මරණය කරනුයේ ,
    1. ජුදාගමේ ඒකදේව වාදයට අදාළ චර්මච්ඡේදන පිළිවෙතින් ඇරඹුමය
    2. මිසරයේ පීඩා වකවානුවේ ඉශ්‍රායෙල් කුළුදුල් පිරිමි බිළිඳුන් ලත් දිව්‍ය රැකවරණය
    3. නිවහල් ජනතාව කානාන් දේශයේ ලත් රැකවරණය
    4 රතු මුහුද තරණයේදී මෝසෙස් තුමාගේ මග පෙන්වීම තුළ ජනතාවලත් ජයග්‍රහණයයි

17. ජුදා පිළිවෙත අනුව පිරිමි දරුවන්ට ටෝරාවට උපගොනුමට අවස්ථාව විවෘත වුයේ,
    1. අවුරුදු 12 දි පියාගේ හා වැඩිහිටියන්ගේ අවසර ලැබීමෙන් පසුවය
    2. අවුරුදු 12 දි ජෙරුසළමේ දෙව් මැදුරේදී අවසර ලැබීමෙන් පසුවය
    3. අවුරුදු 12 වන විට චර්මච්ඡේදනය හා කැප කිරිම සිදුකර තිබීමෙන් පසුවය

4. අවුරුදු 12 දි උත්තම හා නායක පූජකයන්ගේ අනුමැතිය ලැබීමෙන් පසුවයි

18. මිසරයේ කටුක වහල් බැම්මෙන් ගළවනු ලැබ කිරියෙන් පැණියෙන් උතුරන දේශයේ පදිංචි වූ දේව ජනතාව සැමරූ මංගල්‍යය වන්නේ

1 ජුදෙව් පාස්කු මංගල්‍යය2. කූඩාරම් මංගල්‍යය

3.පසුකර යාමේ මංගල්‍යය 4 අස්වැන්න මංගල්‍යය

19. මා පියාණන් වහන්සේගේ මැදූරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහිද මින් කිතුණු ඔබ ලබන පණිවිඩය වන්නේ

1 දේව සබඳතාව වර්ධනය කර ගැනීමට ලැබෙන අවස්ථා පැහැර නොහැරිය යුතුය

2 නොකඩවා දේව නමස්කාරයට සහභාගීවීමෙන් ක්‍රිස්තු අනුගාමීත්වයට සාක්ෂි දැරිය යුතු බව

3 තම පවුල සමඟ දෙව් මැදූරේහි නැමදුම අගය කළ යුතු බවය

4 විභාග වලදී උසස් ප්‍රතිඵල ලබා ගැනීමට දෙව් මැදූරෙහි නමස්කාරය වෙනුවට අධ්‍යාපනයට යොමු විය යුතු බවය

20. කිතුණු දැරියන්ට ප්‍රඥාවෙන් ශක්තියෙන් විනයගරුකව දෙවිදූන් හා ජනතාවගේ ප්‍රසාදය ලබමින් වැඩෙන්නට හැකි වන්නේ ,

1 දේව වචනයේ අන්තර්ගතය ක්‍රිස්තු ඉගැන්වීම් නැමැති අත්තිවාරම මත ජීවිතය හැඩගස්වා ගැනීමෙනි
2 තමා හැදෙන වැඩෙන පරිසරය තුළ අසල්වාසීන් හා සුහඳව දිවි ගෙවීමෙනි
3 පාසලේ විෂය නිර්දේශයෙහි අඩංගු පුරවැසි යුතුකම් ඉටු කිරීමෙනි
4 දහම් පාසලේ හා ශුද්ධ සභාවේ කටයුතුවලට උනන්දුවෙන් දායක වීමෙනි

21. ශුද්ධාත්මයෙන් පූර්ණාව ,තම සේවය ආරම්භ කළ ජේසුස් වහන්සේ මුළු මානව වර්ගයාට පිළිගැන්වූයේ

1 දේව රාජ්‍ය පදනම් කරගත් ප්‍රේමයේ ශුභ අස්නය
2 කන්ද උඩ දේශනය පදනම් කර ගත් භාග්‍යයන් අනාවරණය කළ ශුභ අස්නය
3 යොසායා දිවැසාවලිය පදනම් කරගත් ගැළවීමේ ශුභ අස්නය
ජාතීන්ගේ වි නිශ්චය දවස පදනම් කර ගත් ශුභ අස්නය

22. ධීවර සීමෝන්ගේ ක්‍රියාකලාපය තුළින් දෙවිදූන්ගේ තෝරා ගැනීම පිළිබඳ අපට වටහාගත හැක්කේ දේව කැඳවීම

1 දෙවිදූන්ගේ මිහිපිට අරමුණු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය බවය
2 කන්ද උඩ දේශනය පදනම් කර ගත් භාග්‍යයන් අනාවරණය කළ ශුභ අස්නය
3 ප්‍රතික්ෂේපය හෝ පැකිළීම තුළ නොවෙනස්වන සුළු බවය
4 ලබන්නා තුළ දෙවියන් වහන්සේ ඇත්තාවූ විශ්වසනීය බවය

23. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් තෝරා ගැනීමට පෙරාතුව ගත් පියවර ගුරු කොටගත් කල අපගේ තීරණාත්මක අවස්ථාවලදී ,

1 අපගේ තීරණ මඟින් සිදුවන ඵල විපාක තේරුම් ගැනීමට යැදීම යහපත් වේ

2 නිරන්තරෙන් යාච්ඤාවෙන් දේව මඟ පෙන්වීම ලබා ගැනීම යහපත් වේ

3 දේව අනුමැතිය මත ලැබෙන මඟ පෙන්වීම ක්‍රියාත්මක කිරීම යහපත් වේ

4 වැඩිහිටියන්ගේ අදහස් විමසීම යහපත් වේ

24. ජේසුස් වහන්සේ ධර්මදූතයන්ට දූන් අනුශාසනා දෙස බැලීමේදී අප අයත් කිතුටු සභාවන්ට ලැබෙන ආදර්ශ නම් ,

1 අභියෝග හමුවේ උත්ථාන වීර්යයෙන් සේවයේ යෙදීම

2 ඵල දැරීම මිහිරි හෝ අමිහිරි වුවත් කැඳවීමට විශ්වාසවන්තව රැඳී සිටීම

3 නිරන්තර යැදුම් මඟින් පෙන්වීම සෙවීම

4 පීඩා මැද තමාගේ නිකාය අතහැර වෙනත් නිකායක සරණයාම

25. මිහිපිටදී දේව වචනය ශ්‍රවනය කර පිළිපදින්නට හිමිවන ප්‍රේමණීය සබැඳියාව වනුයේ.ඔවුන්ට

1දෙවිඳුන් දැක ගැනීමේ භාග්‍ය උදාවන බවය.

2 සදාතන ජීවිතයේ පංගුකාරකම හිමි වන බවය
3 කිතුනු ආගමිකත්වයට පත් කරනු ලබන බවය
4 ජේසුස් වහන්සේගේ මෑණියන් හා සහෝදරයන්ලෙස සැබැඳියාවකට ඇතුළත් වන බවය

26. සමාජයෙන් කොන් කරන ලැබූ සුව කළ නොහැකි රෝගී තත්වයකට පත්ව අසහනයෙන් සිටියද ජේසුස් වහන්සේ සිටියද ජේසුස් වහන්සේගේ පාමුලට ඇදහිල්ලෙන් පිවිස පූර්ණ සුවය අත්විඳිය හැකි බවට සාක්ෂි 2ක් වනුයේ
1 කුදු ස්ත්‍රිය හා ජයිරස්ගේ දියණිය .
2 පේදුරුගේ නැන්දනිය හා ජයිරස්ගේ දියණිය
3 ජයිරස්ගේ දියණිය හා මහලේ රෝගයෙන් පෙළුණු ස්ත්‍රිය
4 මහලේ රෝගයෙන්පෙළුණු ස්ත්‍රිය කුදු ස්ත්‍රිය

27. යහපත් ඇමුණක් පෙරදැරි කරගෙන ක්‍රියා කිරිමේදී නීති රීති ලිහිල් කිරිමේ අවශ්‍යතාව අපට පැහැදිළි කර දුන් අවස්ථා දෙකක් වන්නේ
1 අංශභාග රෝගියා සුව කිරීම .
2 දිය උදර රෝගියා සුව කිරීම
3 අතක් පණ නැති මිනිසා සුව කිරීම
4 පේදුරුගේ නැන්දණිය සුව කිරිම

28. ඔබ මේ දේවල් කරනුයේ කාගේ අධිකාරිබලයෙන්ද මෙම ප්‍රශ්නය ජේසුස් වහන්සේට එල්ල කිරිමට හේතුව වුයේ

1 පරිසිවරුජනතාවට දුන්නා වු නායකත්වයට තර්ජනයක් වෙතැයි වු සැකය නිසාය .

2 රෝම ආධිපත්‍යයේ පාලන බලය නිමා වෙතැයි වු සැකය නිසාය
3 ජේසුස් වහන්සේ ජුදෙව්වරුන්ගේ රජ ලෙස අභිෂේක ලබතැයි වු සැකය නිසාය

4ජෙරුසලමේ දෙව් මැදුර තුළ ආධිපත්‍ය පෑ සද්දුසිවරුන්ට තම බලය අහිමි වු සැකය නිසාය

29. වපුරන්නාගේ උපමාව මඟින් එළිදැක්වෙන සත්‍යතාවක් වන්නේ
1 දිනපතා දේව වචනය කියවීමෙන් අභියෝගවලට මුහුණ දිය හැක අංශභාග රෝගියා සුව කිරීම .
2 දේව වචනය නිවරැදිව වටහා ගැනීමෙන් සේවයට යොමු විය හැක
3 දේව වචනය තේරුම් ගැනීමෙන් තර්ක විතර්ක කළ හැක
4 දේව වචනය ශ්‍රවනය කිරිමෙන් ලැබෙන ආත්මික පෝෂණයෙන් අන් අයට ආශිර්වාදයක් විය හැක

30. අධිකරණය එල්ල කළ චෝදනාවට පිළිතුරු වශයෙන් මාළුසේ බැව් පවසන්නේ ඔබමය යනුවෙන් ජේසුස් වහන්සේ වදාළේ කුමන ප්‍රශ්නය ඇසූ විටද?
1 ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝද?.
2 ඔබ ක්‍රිස්තුස්ද?
3 ඔබ සමිඳුන් නමින් වඩිනා තැනැත්තා වහන්සේද
4 ඔබ ජුදෙව් වරුන්ගේ රජුද?

31. සදහටම පවතින ශ්‍රේෂ්ඨ තම ධර්මතාව වන්නේ

1 කරුණාව 2 ප්‍රේමය 3 සමාව දීම 4 ඇදහිල්ල

32. පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහායි යන උදාර සංකල්පය ගෙන ආවේ

1 ගරු චන්ද්‍රාපියතුමා 2 ගරු තිස්ස බාලසූරිය පියතුමා

3 දෙවන පාවුල් පාප් වහන්සේ 4 ද සිල්වා දේව ගැති තුමා

33. කමා වීමේ වැදගත්කම පෙන්වා දීම සඳහා ජේසුස් වහන්සේ ඉගැන්ව උපමාව වන්නේ.

1 යහපත් සාමාරියාගේ උපමා කතාව 2 යහපත් බැටළු එඬේරාගේ උපමා කතාව

3 කමා නොවූ දාසයා පිළිබඳ උපමා කතාව 4 මිදිවැල පිළිබඳ උපමා කතාව

34. අයිරේනියා නැමැති ග්‍රීක වචනයෙන් අදහස් කරන්නේ

1 සම්පූර්ණ ජීවනය 2 සම්පූර්ණ ප්‍රේමය

3 සම්පූර්ණ විමුක්තිය 4 සම්පූර්ණ සාමය

35. 1කොරෙන්ති 13 වන පරිච්ඡේදයේ සඳහන් වන්නේ

1 කන්ද උඩ දේශනාව පිළිබඳ

2 කමා නොවූ දාසයා පිළිබඳ

3 දුක් විඳින සේවකයා පිළිබඳ

4 ප්‍රේම පාරමිතාව

36. ඇදහිල්ල නිසා දුක් වින්ද පුද්ගලයන් දෙදෙනෙක්

1 කුදු ස්ත්‍රිය හා සාකෙවුය්

2 බරබ්බස් හා සාවුල්

4 යොසායා හා ආදම්

3ජෝබ් හා ජෙරමියා ප්‍රේම පාරමිතාව

5

37. දේව රාජ්‍යයේ පුරවැසිභාවය අපේක්ෂිතව යමෙකු දුක් විඳීම පිළිගත යුත්තේ

1 වරප්‍රසාදයක් හා ජයග්‍රහණයක් ලෙසය .
2 දේව ශාපයක් හා තාවකාලික විඳිමක් ලෙසය
3 පාපයකට වන්දි ගෙවීමක් හා ජයග්‍රහනයක් ලෙසය
4 පසුතැවීම තුළින් ලබන ජයග්‍රහණයක් ලෙසය

38. දරුණු අභියෝගාත්මක අවස්ථාවන්හිදී පොරබැදීමේදී දේව ප්‍රේමයේ අසීමිත බව ඔබ අත් විඳිනුයේ

1 යාච්ඤා ශෛල මඟින් ලැබෙන දිරියෙනි .
2 දේව වචනය හැදෑරීට යොමු වීමෙනි
3 පවුලේ සාමාජිකයන් දක්වන ආදරයෙනි.

4 තමාගේ ප්‍රබල යැදුමෙන් ලැබෙන දිව්‍ය ශක්තියෙනි.

39. කිතුණු නම දරන්නන්ගේ ජීවිත ගමනේදී ප්‍රතික්ෂේප කළ යුතු අයහපත් ක්‍රියාදාමයන් අතර මෙය ඉතා වැදගත් වේ.

1 යාවේ දෙවිදාණෝ මිස අතින් සෑදූ දෙවිවරු නොවේ. .
2 සමිඳුන්ගේ දිනය දේව මහිමය උදෙසා මිස විනෝද චාරිකා උදෙසා නොවේ

3 පාපය මිස පාපයට මැදිහත් වූ පව්කරුවා නොවේ.

4 කිතුණු ප්‍රජාවට පමණක් ආගන්තුක සත්කාර දැක්වීම නොවේ.

40. දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා විවෘත වන අවස්ථා මඟ හැරීමේ ප්‍රතිවිපාකය වනුයේ.

1 වඩා වටිනා දෙය තෝරා නොගැනීමෙන් පසුතැවිලිවීමය .

2 දායක වීම සඳහා නැවත අවස්ථා විවර නොවීමය

3දේව වරප්‍රසාද වලට කැමැත්තෙන් පිටුපෑමය.

3 පවතින වටිනා දෙයට වඩා කාලීන දෙයට මුල්තැන දීමය.

සබරගමුවපළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **11 ශ්‍රේණිය**
முதலாம் தவணைப் பரீட்சை2018 தரம்11
**First Term Test 2018** **Grade 11**

**ක්‍රිස්තු ධර්මය–II කොටස**
**Cristian**

**පැය දෙකයි**
***Two hours***

**පළමු ප්‍රශ්නය ඇතුළුව සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**

(01) I දෙවියන් වහන්සේ අබ්‍රහම්ට දුන් පොරොන්දු 2 ක් ලියන්න?.

II ඉශ්‍රායෙල් ජනතාව අතර එඩේර වෘත්තිය කළ පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න ?.

III දස පනත බෙදෙන ප්‍රධාන ගොටස් 02 ක් ලියන්න?

VI ගාබියෙල් දේවදූතයා විසින් දැනුම් දෙන ලද විශේෂ උපත් 02 නම් කරන්න?

V පුරාණ ගිවිසුම හා නව ගිවිසුම තුළ බැටළු එඩේරාණන් ලෙස සැලකුවේ කාවද?

VI ෂාලෝම් යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය කුමක්ද

VII පොරොන්දු දේශය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න .

VIII මෙසියානු සංකල්පයේ ප්‍රධාන ලක්ෂණ 2 ක් ලියන්න ?

IX ජුදෙව් චාරිත්‍ර 2ක් නම් කරන්න

X සමාජය තුළ තිබිය යුතු යහපත් වටිනාකම් 02ක් ලියන්න

(ලකුණු 2x10)

(02) I සම රාජ්‍යය පිළිබඳ ප්‍රකාශ කරන පරණ ගිවිසුමේ ග්‍රන්ථය කුමක්ද? (ලකුණු 2)

II සාම රාජ්‍යයේ ලක්ෂණ 03 ක් ලියන්න. (ලකුණු 3)

III වර්තමානයේ මෙසියාතික රාජ්‍ය පහළ වීමට බාධා කරන කරුණු 05 ක් කෙටියෙන් විස්තර කරන්න

(ලකුණු 5)

(03) I යහපත් එඩේරෙකු තුළ තිබිය යුතු ගුණාංග 2ක් ලියන්න (ලකුණු 2)

II එඩේරුන් ලෙස කිතුණු වස් ක්‍රියා කළ යුතු අයුරු කරුණු 3 කින් ලියන්න යහපත් ගුණාංග ලියන්න (ලකුණු 3)

III බැටළුවන් ලෙස කිතුනු වස් ක්‍රියා කළ යුතු අයුරු කරුණු 5 කින් විස්තර කරන්න . (ලකුණු 5)

(04) I තම ජීවිතයෙන් ප්‍රේමය විදහා පෑ නූතන සමාජයේ චරිත 02 ක් නම් කරන්න (ලකුණු 2)

II ප්‍රේමයේ ලක්ෂණ 03 ක් ලියන්න. (ලකුණු 3)

III ජේසුස් වහන්සේ ප්‍රකාශ කල උතුම්ම ආඥාව නම් කර එම ආඥාව පරණ ගිවිසුම හා සම්බන්ධ වන ආකාරය කෙටියෙන් විස්තර කරන්න . (ලකුණු 5)

(05) I සාමය ඇතිකරන්නෝ භාග්‍යවන්තයෝය...මෙම බයිබල් පාඨයේ ඉතිරි පද පේළිය සම්පූර්ණ කරන්න (ලකුණු 2)

II සාමය බිඳී යන අවස්ථා 03 ක් නම් කරන්න. (ලකුණු 3)

III පූර්ණ සාමයක් ඇති කිරීම පිණිස කිතුණු දරුවෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියා මාර්ග 05 ක් නම් කර කෙටියෙන් විස්තර කරන්න . (ලකුණු 5)

06 I ස්වාමීන් වහන්සේ අපට ඉගැන්වූ යාච්ඤාවේ කමාව පිළිබඳ සඳහන් වී ඇති වදන් පෙළ ලියන්න ? (ලකුණු

IIසභා එකමුතුව සඳහා උත්සහ දරන සංවිධාන 3ක් නම් කරන්න (ලකුණු 3)

IIIකමා වීමේ වැදගත්කම පෙන්වා දීම සඳහා ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමාවෙන් ඔබට ලැබෙන ආදර්ශ 05 ක් කෙටියෙන් විස්තර කරන්න . (ලකුණු 5)

07 I ඒකත්වය පිළිබඳව ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමාව නම් කරන්න ? (ලකුණු 2)

IIසභා එකමුතුව සඳහා උත්සහ දරන සංවිධාන 3ක් නම් කරන්න (ලකුණු 3)

IIIකිතුණුවන් ලෙස ඒකත්වයෙන් කටයුතු කළ හැකි අවස්ථා 05 ක් කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 5)

# පළමු වාර පරීක්ෂණය 2017- ක්‍රිස්තු ධර්මය

## 11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

## 1 කොටස

| | | | |
|---|---|---|---|
| (1) 1 | (11)2 | (21) 1 | (31) 2 |
| (2) 4 | (12)1 | (22)4 | (32)1 |
| (3) 3 | (13)3 | (23)2 | (33)3 |
| (4) 2 | (14)3 | (24)2 | (34)2 |
| (5) 3 | (15) 4 | (25) 4 | (35) 4 |
| (6) 4 | (16) 2 | (26) 4 | (36) 4 |
| (7) 3 | (17) 2 | (27) 2,3 | (37) 1 |
| (8) 1 | (18) 1 | (28) 4 | (38) 4 |
| (9) 3 | (19) 3 | (29) 4 | (39) 3 |
| (10) 1 | (20) 1 | (30)1 | (40) 3 |

II වන කොටස

(01) 1 පිටු අංක 02

2 පිටු අංක 7

3 පිටු අංක 3

4 ජේසුස් වහන්සේගේ උපත හා ස්නාවක ජොහාන්ගේ උපත

5 පිටු අංක 7

6 සම්පූර්ණ සාමය

7 ශුද්ධ වු දේශය, පලස්තීනය,ඉශ්‍රාලය,කිරියෙන් පැණියෙන් උතුරන දේශය සරු අඩ සඳ

8 පිටු අංක 4 , 5

9 කැප කිරීම, චර්මච්ඡේදනය

10 පිටු අංක 2,4

(02) 1යොසායා

2 පිටු අංක 20

3 ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

(03)1 පිටු අංක 7,8

2  පිටු අංක 9

3 පිටු අංක 9 ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

(04) 1 පිටු අංක 14

2 පිටු අංක 16

3 පිටු අංක 17 ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

(05) 1 පිටු අංක 19

2 පිටු අංක 19

3 ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

(06) 1 පිටු අංක 25

2 ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

3 පිටු අංක 28

(07)1 පිටු අංක 29

2 පිටු අංක 31

3 ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

සබරගමුවපළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **09 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை2018** **தரம்09**
**First Term Test 2017** **Grade09**

**ක්‍රිස්තු ධර්මය–II කොටස**

**පළමු ප්‍රශ්නය ඇතුළුව සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**

(01) I දේව මැවිල්ලේ අයිතිකරු කවුද?.

II නෝවාගේ කතව සඳහන් වන ශුද්ධ බයිබලයේ ග්‍රන්ථය කුමක්ද ?.

III ජීවිතයට වටිනාකමක් ලබාදෙමින් දාවිත් ආදරයෙන් රැක බලාගත්තේ කවුද?

VI මාගේ ස්වාමීනි රජ්ජුරුවන් වහන්ස වනුවෙන් සාවුල්ව ඇමතුවේ කවුද?

V ස්වාමින්ගේ යාච්ඤාව සමස්තයන් ලෙස ගෙන සලකා බලන කළ අවධාරණය කෙරෙන ප්‍රධාන ලක්ෂණය වන්නේ කුමක්ද?

VI ජේසුස් වහන්සේගේ ප්‍රථම ප්‍රාතිහාර්ය නම් කරන්න

VII ජුදෙව් චාරිත්‍රයක් නම් කරන්න .

VIII හාරදහසකට ආහාර ලබාදුන් පසු ඉතිරි වූ කුඩු ගණන කීයද ?

IX ඇදහිල්ලෙන් සුවය පතා ජේසුස් වහන්සේ වෙත පැමිණි පුද්ගලයකු නම් කරන්න

X කිතුණු දරුවෙකු තුළ සතු විය යුතු යහපත් ගුණාංගයක් ලියන්න

(ලකුණු 2x10)

(02) I දෙවියන් වහන්සේ නෝවාට ලබාදුන් අණ කුමක්ද? (ලකුණු 2)

II නෝවා පිළිබද දේව වචනයේ සඳහන් වන කරුණු 3ක් ලියන්න. (ලකුණු 3)

III නෝවාගේ ජීවිතයෙන් ඔබට ලබාගත හැකි ආදර්ශ 5 ක් ලියන්න. (ලකුණු 5)

(03) I දාවිත් කෙරෙන් ධර්මිෂ්ඨකම ප්‍රකාශ වූ අවස්ථාවක් නම් කරන්න (ලකුණු 2)

II දාවිත්ගේ ජීවිතයේ පිළිඹිඹු වූ යහපත් ගුණාංග ලියන්න (ලකුණු 3)

III කිතුණු දරුවෙකු ලෙස ඔබට ප්‍රේමයෙන් ක්‍රියා කළ හැකි අවස්ථා 05 ක් ලියන්න. (ලකුණු 5)

(04) I කානාහි සරණ මංගල්‍යයේ මිදි යුෂ හිඟ වූ බව ජේසුස් වහන්සේට සැළ කළේ කවුද ? (ලකුණු 2)

II ජේසුස් වහන්සේ එම අර්බුධය විසඳූ ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 3)

III යාච්ඤාවක ඇතුළත් විය යුතු අංග 05 ක් ස්වාමීන්ගේ යාච්ඤාව ඇසුරින් ලියන්න.(ලකුණු 5)

(05) I යාච්ඤාව යනු කුමක්ද? (ලකුණු 2)

II ජේසුස් වහන්සේ යාච්ඤාව තම ජීවිතයට අදාළ කරගත් අවස්ථා 03 ක් ලියන්න. (ලකුණු 3)

III යාච්ඤාවක ඇතුළත් වි ය යුතු අංග 05 ක් ස්වාමීන්ගේ යාච්ඤාව ඇසුරින් ලියන්න . (ලකුණු 5)

06 I සබත් දවස ශුද්ධ ලෙස පැවැත්විය යුතු බව අවධාරණය කෙරෙන්නේ දස පනතේ කීවෙනි පනතින්ද? (ලකුණු 2)

IIසමාජයේ අවශ්‍යතා ඇති ය පිළිබඳ සැලකිලිමත්වීමේදී මුහුණ දීමට සිදුවන අභියෝග 3ක් ලියන්න (ලකුණු 3)

IIIකිතුණු ප්‍රේමය තුළ එම අභියෝග ජය ගනිමින් අවශ්‍යතා ඇති අය වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න (ලකුණු 5)

# 09 ශ්‍රේණිය

# පිළිතුරු පත්‍රය

# 1 කොටස

| | | | |
|---|---|---|---|
| (1) 2 | (6) 3 | (11) 3 | (16) 2 |
| (2) 3 | (7) 2 | (12) 3 | (17) 3 |
| (3) 1 | (8) 2 | (13) 2 | (18) 2 |
| (4) 2 | (9) 2 | (14) 1 | (19) 1 |
| (5) 2 | (10) 1 | (15) 3 | (20) 3 |

(01)i දෙවියන් වහන්සේ

ii උත්පත්ති පොත

iii මොපිබොෂෙත්

iv දාවිත්

v සාමූහිකත්වය අවධාරණය කිරීම

vi කානාහි සරණ මංගල්‍යයේදී වතුර මිදි යුෂ බවට හැර වීම

vii පිටු අංක 16

viii 7 යි

ix රාජ්‍ය නිලධාරියා

xලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

(02)i නැවක් සෑදීමට

ii පිටු අංක 02

iii පිටු අංක 02, 03, 04 (ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න)

(03)i පිටු අංක 07

ii පිටු අංක 07

iiiලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

(04)i උන්වහන්සේගේ මෑණියෝ

ii පිටු අංක 16

iii ලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න

(05)i පිටු අංක 09

ii පිටු අංක 09

iii පිටු අංක 10 11 12

(06)i 4 වන පනත

ii පිටු අංක 27

iiiලියා ඇති පිළිතුර අනුව ලකුණු දෙන්න